# සෝවියට් සාහිත්‍යය 2

රමිඳු පෙරේරා



චිංගිස් අයිත්මාතව්, මිහයිල් ෂෝලහව් කියන ලේඛකයන් දෙදෙනා(ගෝර්කි හැරුනු විට) සෝවියට් දේශයේ සාහිත්‍යය සම්ප්‍රදාය අධ්‍යනය කිරීමේදී පාදක කරගත හැකි සාම්පලයන් දෙකක්. අයිත්මාතව්ගේ "ගුරු ගීතය" කියන කුඩා නවකතාව අතිශය ජනාදරයට පාත්‍ර වූ සම්භාවනීය කෘතියක්. දුෂ්කර ගමකට පැමිනෙන ආධුනික ගුරුවරයෙක් ග්‍රමට අධ්‍යාපනය ගෙන ඒමට දරන හුදකලා සටන පසුබිම් කරගෙන මේ නවකතාව ගොඩනැගී තිබෙනවා. එම ගුරුවරයා සමග ඔහුගේ ශිෂ්‍යාවක් ආදරයෙන් වෙලෙන අතර මේ ආදර කතාව ගලාගෙන යන්නේ විප්ලවයට හසුවූ කිර්ගීසියානු ගමක සිදුවන වෙනස් වීම් ගැන සිත් ගන්නා සුලූ ඒත්තු ගැන්වීමක් පාඨකයා තුල ඇති කරමින්.

***ඉන්පසු එළැඹෙන්නේ ජනශූන්‍ය දූපතේ ජීවිතය ගැටගසා ගැනීමේ සටන. දෙදෙනා සතුරු පාර්ශව දෙකක යුද වැදුනු අය වුණත් කපිතාන්ට හා මර්යූට්කාට ජීවත්වීම පිණිස එකට වැඩකිරීම හැර වෙන විකල්පයක් නැහැ. පැල්පතක් අටවා ගෙන, ආහාර සොයමින් මේ දෙදෙනා අරඹන ජීවිතය නොබෝ කලෙකින්ම දෙදෙනා අතර ප්‍රේමයක් බවට පත්වෙනවා. රසවත් සිදුවිම් වලින් ගහණව කාලය ගෙවී යන්න පටන් ගන්නවා.........***

***යම් කාලයකට පසු අවසානයේ එක් දිනෙක ඈත සයුරේ යාත්‍රා කරන නෞකාවක් මෙ දෙදෙනාගේ ඇස ගැටෙනවා. ඒ තමයි මේ දෙපල පුල පුලා බලා සිටි මොහොත.***

කාණ්ඩ කිහිපයකින් යුතු විශාල නවකතාවක් වන ෂෝලහව්ගේ "දොන් නදිය නිසලව ගලා බසී" කෘතිය දොන් ගග අසබඩ ප්‍රදේශ වල පරම්පරා කිහිපයක කතාන්දරය ගෙනහැර දක්වනවා. නැවතත් රුසියාවේ ඇති වූ සමාජ වෙනස පිලිබඳ ඉතාම ගැඹුරු හා අතිශය අව්‍යාජ පිලිඹිබු වීමක් එම නවකතාව තුළින් දකින්නට පුලූවන්.

සෝවියට් සාහිත්‍යය තුල ප්‍රවනාත්මක උප සම්ප්‍රදායයක් සැලකිය යුතු ලෙස දැකගැනීමට හැකිවීම තවත් විශේෂ කාරණයක්. යම්කිසි දේශපාලන අරමුණක් වෙනුවෙන් සිය නිර්මාණ හැකියාව යෙදවිම ප්‍රවනාත්මක කලාවේ ස්වභාවයයි. විශේෂයෙන් 1918 සිවිල් යුද්ධය හා දෙවනි ලෝක යුද්ධයේදී හිට්ලර්ගේ ආක්‍රමණය කියන සෝවියට් සමාජය මුහුණ දුන් බරපතලම තර්ජන ආශ්‍රිතව බිහි වූ නිර්මාණ වල මේ ස්වභාවය දකින්නට පුලූවන්.

උදාහරණයක් ලෙස "හතලිස් එක්වැනියා" කියන කෙටිකතාව සැකෙවින් විමසා බලමු.

මර්යූට්කා කියන තරුණියක් වටා මෙම කතාව ගෙතෙනවා. අතිශය දිළිදු නූගත් තරුණියක වන මර්යූට්කා රතු හමුදාවේ සෙබලියක් ලෙස සිවිල් යුද්ධයට බැදෙනවා. ඇය දක්ෂ සටන්කාමියක්. කතාව ආරම්භයේදී මුණගැසෙන විට ඇය සතුරන් 40 දෙනෙකු ඉලක්කය කොට ගෙන වෙඩි තබා ඇති බවට ගණන් සාදාගෙන සිටිනවා.

ඇය අයත් හමුදා කණ්ඩය මේ අතර සටනකට පැටලෙනවා. එම සටනේදී සතුරු "සුදු හමුදාවේ" (රුසියන් විප්ලවයට පසු විප්ලවයට විරුද්ධව කැරලි ගැසූ හිටපු වංශාධිපතින්, නිලධරයන්ගේ නායකත්වය සහිත හමුදාව මේ නමින් හැඳින්වුණා) කිහිප දෙනෙක් මර්යූට්කාගේ කණ්ඩයේ අත් අඩංගුවට පත්වෙනවා. එහි සිටි සුදු හමුදා කපිතන් කෙනෙක් සිරභාරයට ගන්නා මර්යට්කාගේ අණදෙන නිලධරයා එම සිරකාර කපිතන් බලා කියා ගැනීම මර්යූට්කාට පවරනවා. "මොනම තත්වයක් යටතේවත් මොහුට පලා යන්න ඉඩදෙන්න එපා"මේ මර්යූට්කාට ලැබෙන අණයි.

සිරකාර කපිතන්ව බෝට්ටුවකට නංවාගන්නා මර්යූට්කා තව කිහිප දෙනෙකු සමග අභ්‍යන්තර සයුරක් තරනය කරනවා. එහිදී අතරමග බෝට්ටුව කුණාටුවකට හසුවී විනාශ වන අතර මර්යූට්කා සහ සිරකරුවා ජනශූන්‍ය දූපතකට පාවෙනවා.

ඉන්පසු එළැඹෙන්නේ ජනශූන්‍ය දූපතේ ජීවිතය ගැටගසා ගැනීමේ සටන. දෙදෙනා සතුරු පාර්ශව දෙකක යුද වැදුනු අය වුණත් කපිතාන්ට හා මර්යූට්කාට ජීවත්වීම පිණිස එකට වැඩකිරීම හැර වෙන විකල්පයක් නැහැ. පැල්පතක් අටවා ගෙන, ආහාර සොයමින් මේ දෙදෙනා අරඹන ජීවිතය නොබෝ කලෙකින්ම දෙදෙනා අතර ප්‍රේමයක් බවට පත්වෙනවා. රසවත් සිදුවිම් වලින් ගහණව කාලය ගෙවී යන්න පටන් ගන්නවා.

යම් කාලයකට පසු අවසානයේ එක් දිනෙක ඈත සයුරේ යාත්‍රා කරන නෞකාවක් මෙ දෙදෙනාගේ ඇස ගැටෙනවා. ඒ තමයි මේ දෙපල පුල පුලා බලා සිටි මොහොත. පාලූ දූපතෙන් මිදී යලි නිවෙස් බලා යාමට නෞකාව උදව් කරගන්න පුලූවන්. ගිනිමැලයක් ගසා දුම් නංවා කෙසේ හෝ නෞකාවේ අවධානය තමන් වෙත යොමුකරගන්න මේ දෙදෙනා සමත් වෙනවා. ඉතින් පෙම්වතුන් යුවල ගලවාගනු වස් නෞකාව ක්‍රමයෙන් දූපත වෙත ළඟා වෙනවා.

දූපතට හොඳටම නෞකාව ළං වූ විට මර්යූට්කා දකින්නේ කුමක්ද? එම නෞකාව සුදු හමුදාවට අයත් යුද්ධ නැවක් බව ඇය දකිනවා. තම

"සගයන්ගේ" නැවක් දකින කපිතාන් තරුණයා සතුටින් ඔල්වරසන් දෙන්න පටන් ගන්නවා. ඒක ඔහුට විශාල සතුටක්. කපිතාන් ඔල්වරසන් දෙද්දී මර්යූට්කා ඔහු දෙස බලා සිටිනවා. ඇය තුල විවිධ හැගීම් පෙරලි කරන්න ගන්නවා.

නැව ආවිට කපිතාන් එහි නැගී යලි සිය සගයන් අතරට යනු ඇති.

"මොනම තත්වයක් යටතේවත් මොහුට පලා යන්න ඉඩ දෙන්න එපා" තමන්ට භාර වූ වගකීම මර්යූට්කාගේ හිසට නැගෙනවා. ඉතිරි වී තිබෙන කාලය සීමිතයි. මර්යූට්කා විකල්ප දෙකක් මැද අතරමං වෙනවා.

සිය පෙම්වතාට ගැලවී යන්න ඉඩ දෙනවාද? තමන්ගේ වගකීම ඉටු කරනවාද?

පුද්ගලික ප්‍රේමයද? සිය විශ්වාසයද?

වහා තීරණයකට එන මර්යූට්කා හින බැඳි රිවෝල්වරය අතට ගන්නවා. ඉක්බිති කපිතන්ගේ (සිය පෙම්වතාගේ) හිස් කබල පුපුරා යන ලෙස වෙඩි තබන ඇය ඔහු එතනම මරා දමනවා.

අවසන ඔහුගේ මලකද බදාගන්නා ඇය වැලපෙන්නට පටන් ගන්නවා.

හතලිස් දෙනෙක්ට වෙඩි තැබූ ඇයගේ හතලිස් එක්වැනි ඉලක්කය වූයේ සිය පෙම්වතායි. " හතලිස් එක්වැනියා" කතාවේ සාරාංශය එබදුයි.

මෙවැනි කෙටිකතාවක් "ප්‍රචාරකවාදී" යැයි ඇතැම් විට චෝදනාවට ලක්විය හැකි වුණත් තේරුම් ගත යුත්තේ ඒවා නිර්මාණය වෙන සන්දර්භයයි. පුද්ගලිකව ආපසු යමක් අපේක්ෂා නොකර වඩා සාධාරණ සමාජයක් වෙනුවෙන් සටන් කල රුසියානු ගැහැණුන් සහ මිනිසුන්ගේ ආධ්‍යාත්මය මෙවැනි කතාවක ආත්මය ලෙස සටහන් වී තිබෙනවා.



කෙසේ නමුත් සෝවියට් සාහිත්‍යයේ තවත් පැතිකඩ කිහිපයක් තිබෙනවා. ළමා සාහිත්‍යය හා විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යය ඒ අතර අතිශය විශිෂ්ටයි. සෝවියට් ළමා කතා අප රට කුඩා ළමුන් පවා එක්තරා කාලයක ඉතා සෙනෙහසින් වැළඳ ගන්නා ලද එකක්.

(අනිත් සියලූ කතා අමතක කලත් ඔබත් සමහර විට රසවිද ඇති "වැඩබැරි දාස" කතා පෙළ මතක් කරගන්න).

සමාජමය සංවේදීතාවයක් සහිතව ගොඩනැගුන සෝවියට් සාහිත්‍යය කියන්නේ කොහොම වුණත් ඕනෑම කියවන්නෙක් තුළ විශාල වෙනස්කමක් ඇති කල හැකි වර්ගයේ සාහිත්‍යයක්. සමාජවාදී අදහස් වලට ආකර්ෂනය වෙන බොහෝ දෙනෙක් තමන්ගේ දේශපාලන හෝඩියේ අ යන්න ඉගෙන ගත්තේ සෝවියට් සාහිත්‍යය ඇසුරින්.

වඩා නිදහස් හා සාධාරණ ලෝකයක් ගොඩනගනු වස් එක්තරා යුගයක, එක්තරා දේශයක සාමාන්‍ය ගැහැණුන් හා මිනිසුන් ගෙන ගිය යෝධ සටන නිර්ව්‍යාජ විදිහට එම සාහිත්‍යය දහරාව තුළ සටහන්ව තිබීම ඊට හේතුවයි.

සෝවියට් සාහිත්‍යය සම්බන්ධයෙන් තියෙන ප්‍රබල විවේචනයක් නම් එය ප්‍රචාරකවාදී එකක් බවයි. ඒ කියන්නේ සාහිත්‍යයික අගය මරාගෙන දේශපාලන සන්නිවේදනය පිළිබඳ අරමුණක් ඒ තුළ තිබෙන බව බොහෝ විට බටහිර සාහිත්‍යය විචාරකයන් විසින් මතු කරන අදහසක්.

මේ නිරීක්ෂණය බැරෑරුම් ලෙස ගත යුතු නිරීක්ෂණයක්. එනම් එහි යම් සත්‍යතාවයක් තියෙනවා. පසුකාලින සෝවියට් නිර්මාණ බොහෝමයක් මුල් ඒවා වගේ සාර්ථක නොවීමට මෙම ප්‍රචාරකාත්මක ලක්ෂණය හේතුවක් වුණා. මෙම "ප්‍රචාරකවාදී වීම" සෝවියට් දේශයේ දේශපාලනයේ පසුකාලයක නැගී ආ නිලධාරිවාදී පිරිහීමත් එක්කම සම්බන්ධ කරල සාකච්ඡා කල යුතු සිදුවීමක්. සෝවියට් සාහිත්‍යය සමස්තයක් ලෙසම ප්‍රචාරකවාදී ද? හැම කෘතියකටම ඒ චෝදනාව වලංගු ද? "ප්‍රචාරකවාදය" තුළම කලාවක් හොයාගන්න බැරිද?

කෙසේ වෙතත් අවසන් වශයෙන් කිව යුත්තේ මේ කිසිදු කරුනකින් සෝවියට් සාහිත්‍යය දහරාව තුල ඇති සුවිශේෂී අනන්‍යතාවය ,එහි වෙනස හා එහි කලාත්මක අපූර්වත්වය අවප්‍රමාණය කල නොහැකි බවයි.

*(ඊළඟ කලාපයට)*

